**දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව - 2023**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මං මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින්   නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.676,650 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම හා පෙර වර්ෂයට අදාළ රු.83,158 ක පොලී ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් තැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.759,808 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 අවසන් ගිණුම සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

#### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි | 248,927,701 | (i) ඉඩම් ඔප්පු<br>(ii) සමීක්ෂණ මණ්ඩල වාර්තා<br>(iii) ස්ථාවර වත්කම් ලේඛන | ඉඩම් ඔප්පු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මඟින් ප්‍රදානය කිරීම් සිදු නොවීම හේතුවෙන් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | මෝටර් රථ හා කරත්ත | 82,554,814 | (i) ස්ථාවර වත්කම් ලේඛනය<br>(ii) සමීක්ෂණ මණ්ඩල වාර්තා | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 28,212,796 | ස්ථාවර වත්කම් ලේඛන | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| | ලී බඩු හා සවිකිරීම | 5,273,253 | | | |
| | මිශ්‍ර තැන්පත් | 95,569 | (i) ශේෂ සනාථ කිරීම්<br>(ii) උපලේඛන හා ලේඛන | - එම - | - එම - |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | | |
| | (i) | 33, 34 සහ 35 රීතිය | වරිපනම් බදු මුදල් පැහැර හරින්නන් පිළිබඳ ලැයිස්තු පිළියෙල කර දේපල තහනම් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අවශ්‍ය නීතිමය කටයුතු ආරම්භ කර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) | 59 සහ 67 රීති | සෑම වර්ෂයකම ආරම්භයේ දී ආදායම් පරීක්ෂක හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද්දා වූ නිලධාරියෙකු විසින් සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා වෙළෙඳ ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර සෑම වර්ෂයකම මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ආදායම් පරීක්ෂක තනතුර මේ වන විට පුරප්පාඩු වී ඇති අතර එම තනතුරෙහි වැඩ බලන නිලධාරියා කාර්යාල කාර්යය සහයකවරයෙකි. ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ ලේඛනය යාවත්කාලීන කිරීම සඳහා උපදෙස් ලබා දී කඩිනමින් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | - එම - |
| | (iii) | 218 රීතිය | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කරවීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පරීක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකරන බව. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය | | වාහන ඉන්ධන දහන පරීක්ෂාව මාස 12 කට වරක් හෝ කිලෝමීටර් 25,000 ක දුර ධාවනය කිරීමෙන් පසුව පරීක්ෂා කළ යුතු වුවත් | සියලු වාහනවල ඉන්ධන පරීක්ෂාවන් මේ වසර තුළ සිදු කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

සභාව විසින් එලෙස කටයුතු
කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,707,370 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,903,119 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 1,639,312 | 1,833,172 | 1,664,976 | 2,319,442 | 1,649,311 | 1,483,222 | 1,555,086 | 2,151,246 |
| ii. | කුලී | 17,544,027 | 15,726,511 | 14,850,934 | 2,769,076 | 16,341,697 | 10,844,798 | 19,072,517 | 1,893,499 |
| iii. | බලපත්‍ර ගාස්තු | 2,125,500 | 2,503,210 | 2,520,710 | 508,800 | 2,102,500 | 2,331,712 | 2,167,062 | 526,300 |
| iv. | වෙනත් ආදායම් | 7,908,310 | 10,233,586 | 8,538,811 | 1,964,465 | 4,387,860 | 5,198,578 | 5,398,102 | 269,689 |
| | එකතුව | **29,217,149** | **30,296,480** | **27,575,431** | **7,561,783** | **24,481,368** | **19,858,310** | **28,192,767** | **4,840,734** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.2,319,442ක් වූ අතර 2023 ජනවාරි 01 දින වන විට අයකර ගත යුතුව පැවති හිඟ වරිපනම් රු.2,151,246ක වටිනාකමකින් 2023 වර්ෂයේ දී රු.272,376ක මුදලක් පමණක් අයකරගෙන තිබූ අතර, ඒ අනුව හිඟ මුදල් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 13ක පමණ ඉතා පහළ අගයක පැවතුණි. | ස්ථිර ආදායම් පරීක්ෂකවරයෙකු සභාව තුළ නොමැති වීම නිසා හිඟ ආදායම් එකතු කර ගැනීමේ ප්‍රමාදයන් සිදු වේ. එය හැකිතාක් දුරට කළමනාකරණය කර හිඟ ආදායම් අවම කර | පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගැනීමට කටයුතු කරන බව. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ශේෂය රු.2,263,942ක් වූ අතර හිඟ මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ කඩ කුලී ආදායම් එකතු කිරීම සඳහා අදාළ හිඟ කඩ කුලී හිමියන් වෙත අවසන් නිවේදන යවා නීතිමය කටයුතු සිදුකර අයකර ගැනිමට කටයුතු සිදු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කාරණා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා 05 ක් පමණක් පනවා තිබුණි. | විගණනය විසින් දිගින් දිගටම පෙන්වා දෙනු ලබන ප්‍රාදේශීය සභා පනතේ 123 යටතේ අතුරු ව්‍යවස්ථා නැති වීම සම්බන්ධව නැගෙනහිර පළාත් සභාවේ අනුමැතිය ලබාදීමේ ප්‍රමාදයන් සිදුවන අතර දැනට අතුරු ව්‍යවස්ථා 05ක් පනවා කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා පනවා කටයුතු නීත්‍යානුකූල කර ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිසර බලපත්‍රයේ අමතර නියම හා කොන්දේසි අංක 2.2 හා 2.3ට පටහැනිව මාසිකව ජනනය වන ටොන් 16 ක පමණ නොදිරන කසල පස් අතුරා වසා දැමීමකින් තොරව විවෘත භූමියේ බැහැර කර තිබුණි. මේ අනුව නොදිරන කසල විවෘත භූමියේ බැහැර කිරීම තුළින් දැඩි පරිසර හානියක් සිදුවන බැවින් නොදිරන කසල ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙලක් කෙරෙහි සභාවේ කඩිනම් අවධානය යොමුවිය යුතුව පැවතුණි. | නිසි අපද්‍රව්‍ය ගබඩා පිළිවෙත් අනුගමනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | කසල බැහැර කිරීමේ ක්‍රමවේදය විධිමත් විය යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් මාසිකව දිරන කසල ටොන් 04ක් සහ නොදිරන කසල ටොන් 16ක් වශයෙන් 2023 වර්ෂයේ දී කසල ටොන් 240ක ප්‍රමාණයක් රු.10,770,730ක වියදමක් දරා රැස්කර තිබූ අතර දිරන කසලවලින් කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 950ක ප්‍රමාණයක් නිෂ්පාදනය කර එම | රසායනික පොහොර නැවත භාවිතයට ඉඩදීම මත කාබනික පොහොර සඳහා ඇති ඉල්ලුම අඩු වීම හේතුවෙන් අලෙවිය අඩු විය. එබැවින් නිෂ්පාදනය අඩුකර ඇත. කාබනික පොහොර භාවිතය පිළිබඳ මහජනතාව දැනුවත් කර ඉල්ලුම | කොම්පෝස්ට් නිෂ්පාදනය සහ අලෙවිය ඉහළ නැංවීමේ වැඩපිළිවෙලක් කෙරෙහි සභාවේ |

| | | |
|---|---|---|
| තොගයෙන් කිලෝග්‍රෑම් 800ක ප්‍රමාණයක් අලෙවි කර රු.16,000ක ආදායමක් පමණක් රැස්කර තිබුණි. | වැඩි කිරීමට වැඩසටහන් සිදු කිරීමට කටයුතු සූදානම් කරන බව. | අවධානය යොමු විය යුතුය. |
| (ඇ) 2022 භාණ්ඩ සමීක්ෂණය මගින් ඌන යැයි හඳුනාගත් භාණ්ඩ අයිතම 62ක් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අදාළ භාණ්ඩ සභාව වෙත ගෙන්වා ගැනීමට හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, ගබඩා පාලන පිළිවෙත් විධිමත් කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුවිය යුතුව පැවතුණි. | නිසි ගබඩා පාලන පිළිවෙත් අනුගමනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අදාළ භාණ්ඩ සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් දේපල මත 2011 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව වරිපනම් බදු අයකරනු ලබන අතර කාලීනව එම දේපල තක්සේරු කර ඒ මත වරිපනම් බදු අය කිරීමට පියවර ගෙන නොතිබුණි. | 2011 න් පසු නැවත තක්සේරුවක් සිදු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් විටින් විට ඉල්ලීම් කර ඇතත් මෙතෙක් ඒ පිළිබඳව පිළිතුරක් නොලැබී ඇත. නැවත ඉල්ලීම් කිරීමට කටයුතු කරන බව. | කාලීනව තක්සේරු කර බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව සතුව පවතින භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන 05 ක් වසර 02 සිට වසර 09 දක්වා කාලයක සිට නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය වූ අතර ඉන් වාහන 04 ක් අපහරණය සඳහා හඳුනාගෙන තිබුණ ද අපහරණ කටයුතු අවසන් කර නොතිබුණි. | වාහන අයිතම 04ක අපහරණ කටයුතු නැගෙනහිර පළාත් සභාව විසින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. බැකෝ ලෝඩරය අලුත්වැඩියා කිරීමට රු.ලක්ෂ 35ක් පමණ වැය වන අතර එම මුදල් සභාවට දැරීමට නොහැකි බැවින් අලුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයේ පවතින බව. | අක්‍රීය තත්ත්වයේ පවතින වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (PT 02) යටතේ පාසල් බෑග් සහ පාසැල් පාවහන් නිෂ්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිත ගොඩනැගිල්ල නවීකරණ කටයුතු සඳහා ප්‍රතිපාදන ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිත ගොඩනැගිල්ල ඉදිකිරීම, දෙවන අදියර යටතේ ක්‍රියාත්මක කරන ලෙස අනුමැතිය ලබා දුන් අතර එම උපකරණ තාවකාලිකව පැරණි ප්‍රාදේශීය සභා | ගොඩනැගිල්ල නවීකරණය කර යන්ත්‍ර හා උපකරණ භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| සඳහා ප්‍රාදේශීය සභාව විසින් මිලදීගෙන තිබූ රු.18,328,150 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අයිතම 23 ක් භාවිතා නොකර ගබඩාවේ නිෂ්කාර්යව පවතින අතර භාවිතා නොකර තිබිය දී ඒවායේ වගකීම් කාලයෙන් මාස 09 ක් මේ වන විට ඉක්මවා ගොස් තිබුණි. | ගොඩනැගිල්ල තුළ ස්ථානගත කර ඇත. ගොඩනැගිලිවල අළුත්වැඩියා කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර අවසන් වූ වහාම මෙම උපකරණ එම ස්ථානයේ ස්ථාන ගත කිරීමට නියමිත බව. | |

**3.5 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව භාරයේ පවතින වාහන 07ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය ඉදිරි වර්ෂයේ දී සභාව නමට පවරා ගන්නා බව. | වාහනවල අයිතිය සභාව නමට පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් සුසාන භූමි 44ක්, ක්‍රීඩා පිටි 38ක් හා අනෙකුත් ගොඩනැගිලි පිහිටි ඉඩම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව සතු වාහන 03ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ තනතුරු 15 ක් පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් අදාළ තනතුරුවල කාර්යයන් ඉටුකරවා ගැනීමේ ගැටලු මතු වී තිබුණි. | විගණනය විසින් දක්වා ඇති පරිදි සේවක පුරප්පාඩු පැවතීමත් ඒ අනුව අප ආයතනයේ කාර්යයන් සිදු කිරීමේදී ගැටළු පැන නැගීම් ඇති වුවද නැගෙනහිර පළාත් සභාව විසින් මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම මත මෙම ගැටළුව නිරාකරණය කළ නොහැකි වී ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 විගණන කමිටුව**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන සහ | අභ්‍යන්තර විගණන කමිටුවක් මෙම වසර සඳහා සක්‍රීයව ක්‍රියාත්මක කරමින් පවතින බව. | විගණන හා කළමනාකරණ කමිටුව සඳහා ක්‍රියා පටිපාටි ආරම්භ කර රැස්වීම් පැවැත්වීමට පියවර ගත යුතුය. |

කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

### 4.2 තිරසාර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් 23 අංක ජ.ලේ.පොදු/2018.61 දරන චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන අරමුණු සහ පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර එමඟින් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලසීමට සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන අරමුණු සහ පරමාර්ථ හඳුනාගෙන ඇති අතර එය ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන පරමාර්ථ සහ අරමුණු ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලැසීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. |